**ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිලිබඳ අදහස් දැක්වීම**

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 ප්‍රකාරව

I. පෙර වර්ෂයට අදාලව නිවැරදි කර තිබූ ක්ෂය හා අසම්භාව්‍ය වගකීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුල සිදු කල යුතු හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

II. ප්‍රමිත අංක 10.8 ප්‍රකාරව ආයතනය වෙත පවරා දී තිබූ අක්කර 02 රූඩ් 02 ක භූමි ප්‍රමාණයේ පිරිවැය ආරම්භක ශේෂය නැවත පිහිටුවීමක් ලෙස සලකා ගැලපීම මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කිරීම වෙනුවට වර්ෂය තුල මිලදීගත් වත්කමක් ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක16 ප්‍රකාරව පාරිතෝෂික වෙන් කිරීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයේ හෙළිදරව් කිරීම් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වෙන් කිරීම් රු.109,460 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ප්‍රකාරව වර්ෂය තුල මිලදී ගත් වත්කම් සමානුපාතික පදනම මත ක්ෂය කර නොතිබුණු අතර වර්ෂය තුලදී මිලදීගත් රු.9,100,000 ක් වටිනා මෝටර් රථය ස්ථාවර වත්කමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පෙර වර්ෂයේ රු.291 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂයට තුඩු දුන් හේතු හදුනාගෙන නිවැරදි කිරීම වෙනුවට එම ශේෂය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයට ගලපා තිබුණි.

(ආ) අධ්‍යයන ශාලා සඳහා මිලදී ගත් රු. 223,850 ක් වූ පුටුවල වටිනාකම ප්‍රාග්ධනිත නොකර පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) වර්ගීකරණ දෝෂ හේතුවෙන් හා සමානුපාතික පදනම මත ක්ෂය නොකිරීම නිසා සාමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.583,994 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ඉදිරි වර්ෂය වෙනුවෙන් කරන ලද රු.147,170 ක් වූ ගෙවීම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඉ) වර්ෂය තුල ලද රු.19,850,000 ක ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම්, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය යටතේ ඉදිරිපත් කර නොතිබුණි.

### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

හිටපු සභාපතිවරයකු විසින් ආයතනය සතු භාණ්ඩ නැවත ආපසු භාර නොදීමෙන් හා වාහනයක් අනවසරයෙන් පාවිච්චි කර අනතුරකට ලක් කිරීමෙන් ආයතනයට සිදුවූ අලාභය වෙනුවෙන් අය කර ගත යුතු මුළු මුදල රු.282,227 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන වල ලැබියයුතු වටිනාකම ලෙස දක්වා තිබුණේ රු.57,226 ක් පමණි.

### 1.2.4 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) රජයේ මුදල් රෙගුලාසි | |
| I. මුදල් රෙගුලාසි 395(ඌ) | මුදල්පොත පවත්වාගෙන යාම, චෙක්පත් ලිවීම, බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම, දෛනිකව මුදල් බැංකුගත කිරීම යන කාර්යයන් එකම නිලධාරිණියක විසින් සිදුකර තිබුණි. |

| | |
|---|---|
| II.මුදල් රෙගුලාසි 396(ඇ) | 2011 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව මාස 06 ක් ඉක්මවූ රු.59,996 ක වටිනා චෙක්පත් 54 ක් පැවති අතර එ සම්බන්ධයෙන් මු.රෙ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. |
| III. මුදල් රෙගුලාසි 446(2) | මුදල් පොත ශේෂ කරන අවස්ථාවලදී මෙන්ම වර්ෂ අවසාන මුදල් ශේෂයද නිවැරදි බවට වගකිවයුතු නිලධාරියකු සිය අත්සන යොදා තහවුරු කර නොතිබුණි. |

(ආ) චක්‍රලේඛ

| | |
|---|---|
| අංක 2004/පුස/1 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ උපදේශක චක්‍රලේඛය -3.1 ජේදය,3.2 ජේදය | වාර්ෂික තොග සමීක්ෂණයක් හා පුස්තකාලයාධිපති ස්ථාන මාරු ලබා යන අවස්ථාවකදී තොග සමීක්ෂණයක් අනිවාර්යයෙන්ම කල යුතු වුවත් 2012 මැයි 02 වන දින තෙක් එම අවශ්‍යතාවය සපුරා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ජාතික ප්‍රසම්පාදන නියෝජිත චක්‍රලේඛ අංක 08 හා 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රයේ 2.8.1(අ) | තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීමකින් තොරව රු.113,200 කට වායු සමීකරණ යන්ත්‍රයක්, රු.250,000 කට මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර් දෙකක් සහ රු.139,600 කට ජායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. |
| (ඈ) | 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනතේ 15 (1) වගන්තිය | ආයතනයේ ප්‍රවර්ධනය උදෙසා ගනු ලබන පියවර වල ඵලදායකත්වය, ගැටළු විසදීම සහ සංවර්ධනය පිලිබද සාකච්ජා මණ්ඩලයක් සැකසීම සදහා ජාතික ඒකාබද්ධතා විෂය පිලිබද විෂය භාර අමාත්‍යවරයා විසින් උපදේශක මණ්ඩලයක් පත්කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතු වලින් පසු රු. 997,495 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,868,516 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,866,011 ක වර්ධනයක් ඇති වී තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේදී පෙර වර්ෂයට සාපේක්ෂව අනෙකුත් ආදායම 117% කින් වැඩි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| | 2011 | 2010 | වෙනස්වීම් | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුහුණු පාඨමාලා මත ආදායම | 5,027,877 | 885,000 | 4,142,877 | 468.12 |
| පොත් විකුණුම් ආදායම | 1,085,040 | 2,477,835 | 1,392,795 | (56.21) |

## 2.3 වියදම්වල වැඩිවීම

සමාලෝචිත වර්ෂයේ දී ඉකුත් වර්ෂයට සාපේක්ෂව වියදම්වල 85% ත් 360% ත් අතර වැඩිවීමක් දක්නට ලැබුණි. විස්තර පහත දැක්වේ.

| | **2011** | **2010** | **වෙනස** | **%** |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| සැපයුම් | 805,154 | 435,940 | 369,214 | 84.69 |
| මූල්‍ය වියදම් | 72,380 | 15,750 | 56,630 | 359.55 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

(අ) ක්‍රියාකාර් සැලැස්මෙහි ඇතුළත් වු පහත දැක්වෙන ක්‍රියාකාරකම් වර්ෂය තුළ ක්‍රියාත්මක නොවී තිබූ අතර සමහර ක්‍රියාකාරකම් ඇස්තමේන්තුගත ඉලක්ක කරා ලගා නොවී තිබූ බව නිරීක්ෂණය විය.

| | සැලසුම් වැඩසටහන | ඉලක්කගත වියදම | තථ්‍ය වියදම | භෞතික ඉලක්ක | ඉලක්කකරා ලඟාවීම් |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | | |
| 01. | භාෂා අධ්‍යයන කටයුතු පිළිබඳ ඉන්දියානු අධ්‍යයන ආයතනයට චාරිකාව | 1,400,000 | - | 01 | - |
| 02. | නිල නිවාස 02 ක් තැනීම | 10,500,000 | - | 01 | - |
| 03. | කියවන්නන් සඳහා ත භාෂා සම්පත් කට්ටලයක් පිළියෙල කිරීම | 350,000 | - | 01 | - |
| 04. | ආයතන වලින් කරනු ලබන ඉල්ලීම් වලට අනුව පවත්වනු ලබන විශේෂ පුහුණු වැඩසටහන් | 236,000 | 446,793 | 05 | 02 |
| 05. | පාඨමාලා සංවිධානය කිරීමේ හා සැලසුම් කිරීමේ වැඩමුළු | 500,000 | 337,044 | 05 | 04 |
| 06. | පලාත් මට්ටමේ භාෂා පුහුණු කිරීමේ මධ්‍යස්ථාන | 4,800,000 | 1,214,596 | 04 | 01 |
| 07. | වීඩියෝ වාර්තාමය වැඩසටහනක් නිර්මාණය කිරීම | 100,000 | 699,595 | 01 | 01 |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුස්තකාලාධිපතිනිය 2011 නොවැම්බර් මස 30 දින සේවයෙන් ඉවත් වී ඇති අතර එතැන් සිට පුස්තකාලය වසා දමා ඇති බව 2012 මැයි 02 වන දින සිදු කල විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) 2010 වර්ෂයේ නිවාඩු ලේඛනය විධිමත්ව පවත්වාගෙන ගොස් නොමැති බව විගණනයේදී පෙන්වා දුන් නමුත් 2011 වර්ෂයේ වන විටත් එය විධිමත්ව පිළියෙල කර නොතිබුණි.එසේ තිබියදීත් නිලධාරිණියන් දෙදෙනෙකු 2011 වර්ෂයේදී ඉකුත් නිවාඩු ලබාගෙන තිබුණි.

(ඇ) තාක්ෂණික ඇගයීම් වාර්තාවකන් තොරව ඉදිරිපත් කල අවම මිල ප්‍රතික්ෂේප වීමට හේතු නොදක්වා ඊට වඩා රු.23,200 ක වැඩි මිලක් ඉදිරිපත් කර තිබූ ආයතනයකින් වායු සමීකරණ යන්ත්‍ර දෙකක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

3.3 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) 2011 දෙසැම්බර් 31 උනට කාර්ය මණ්ඩලයේ තත්වය පහත සදහන් පරිදි විය.

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| 1.විධායක | 10 | 03 | 07 |
| 2. විධායක නොවන | 09 | 06 | 03 |
| 3.අනෙකුත් | 08 | 07 | 01 |
| එකතුව | 27 | 16 | 11 |

(ආ) ආයතනයට බඳවාගෙන තිබූ පර්පාලන නිලධාරිනියක් විසින් පෞද්ගලික ආයතනයක මාස 16 ක් සේවය කර ඇති බවට ඉදිරිපත් කර තිබූ සහතිකයක එම ආයතනයේ ලිපිනය හෝ දුරකතන අංකයක් සදහන් වී නොතිබුණි. මෙම නිළධාරිණියගේ සේවා ස්ථානය අගලවත්තේ පිහිටි කාර්යාලය වුවත් කොළඹ කාර්යාලයේදි පැමිණීමේ හා පිටවීමේ අත්සන් කර තිබුණි.

**4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

**4.1 සංයුක්ත සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය සහ 2007 දෙසැම්බර් 18 දිනැති අංක පීඊඩී 47 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සංයුක්ත සැලැස්ම හා යාවත්කාලන කරන ලද අයවැය ලේඛනය මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් එම විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. තවද 2011-2014 වර්ෂවලට අදාල සංයුක්ත සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණේ 2011 අගෝස්තු 10 දින විය.

## 4.2 ක්‍රියාකාර් සැලැස්ම

ආයතනයේ අරමුණු සහ ඉලක්ක සමග ඒ ඒ ක්‍රියාකාරකම් සඳහා කළමනාකරුවන්ගේ වගකීම පැහැදිලිව හඳුනාගත හැකි ආකාරයට 2011 වර්ෂය සඳහා වූ ක්‍රියාකාර් සැලැස්ම පිළියෙල කොට නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ දුර්වලතා වරින් වර ආයතනයේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) අභ්‍යන්තර පාලනය
(ආ) වාහන උපයෝජනය
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඇ) පුස්තකාල පාලනය
(ඉ) වත්කම් කළමණාකරනය
(ඊ) ගිණුම්කරණය
(එ) මූල්‍ය පාලනය